සම්මා සංකප්ප

# ඉතිපිසෝ ගාථාවේ සරල තේරුම

ඉතිපි සො භගවා අරහං සමමා සමබුදෙධා
විජජා චරණ සමපනෙනා සුගතො ලොකවිදූ අනුතතරො
පුරිසදමම සාරථී සත්ථා දෙවමනුසසානං බුදෙධා භගවාති

සම්මා සංකප්ප

අරහං

– අප භාග්‍යවතුන් වහන්සේ
චතුරාර්ය සත්‍ය අවබෝධ කල
සේක.
– සසර පෙර පුරුදු සමගම සියලු
කෙළෙසුන් නැසූ සේක.
– සියලු පාපයන්ගෙන් මිදුන
හෙයින් ,රහසින්වත් පවු නොකළ
සේක.
– සියලු ලෝ වැසියන්ගේ, උතුම්
ආමිෂ පූජාවන්, අති උතුම් ප්‍රතිපත්ති
පූජාවන්, සියල්ලටම සුදුසු වන
සේක

බුදුවරයෙකුටම ආවේණික මෙම
ගුණයන් හේතුවෙන් අරහං නම්
වන සේක. මෙම අරහං ගුණය සීල,
සමාධි, පඤ්ඤ, විමුක්ති, විමුක්ති
ඥාන දස්සන ලෙස අංග පහකින්
යුක්ත ය.

සම්මා සංකප්ප

## සම්මා සම්බුද්ධ

අප භාග්‍යවතුන්
වහන්සේ, දුක, දුක හට
ගැනීම, දුක නැති කිරීම
සහ දුක නැති කරන
මගද යන පරම සත්‍ය
හතර තමන් වහන්සේ
විසින්ම, අවබෝධ
කොරගත් හෙයින් සම්මා
සම්බුද්ධ නම් වන සේක

සම්මා සංකප්ප

විජ්ජා චරණ

බුදුපියාණන් වහන්සේ
විද්‍යා ඥාණ අට, පසලොස්
සරණ ගුණයන්ගෙන්
යුතුව, සීල සමාධි ප්‍රඥා
යන ත්‍රිශික්ෂාවෙන්
සම්පන්නව අවිද්‍යාව නම්
මෝහාන්ධකාරය
දුරුකල බැවින්
විජ්ජාචරණ නම් වන
සේක.

# සුගත

සම්මා සංකප්ප

ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය
හෙවත් මැදුම්
පිළිවෙතෙහි ගමන්
කරමින් අමා මහ
නිවනට සපැමිණී
බැවින්ද, යථාවාදී
තථාකාරී වන බැවින්ද,
ප්‍රිය වචන දේශනා කල
බැවින්ද, ප්‍රිය මනාප වූ
බැවින්ද බුදුරජාණන්
වහන්සේ සුගත නම් වන
සේක.

සම්මා සංකප්ප

## ලෝකවිදූ

බුදුරජාණන් වහන්සේ
තුන් ලෝකය පිළිබඳ
සියලු දේ හොඳින්
අවබෝධ කරන ලද
බැවින් ලෝකවිදූ නම්
වන සේක.

සම්මා සංකප්ප

අනුත්තර

බුදුන් වහන්සේට සමාන හෝ උසස් ජීවියෙකු ලොව පහල නොවන හෙයින් අනුත්තර නම් වන සේක.

සම්මා සංකප්ප

පුරිසදම්ම සාරථී

දමනය කරන්නට අසීරු
දෙව් බඹුන් ද, යකුන්ද
දමනය කල බැවින් පුරිස
ධම්ම සාරථී නම් විය.

සම්මා සංකප්ප

සත්ථා දේව මනුස්සානං

දෙව් මිනිසුන් ආදී ලෝ
වැසි සියළු සතුනට
ශාස්තෲවරයාණන්
වෙමින් සසර කතරින්
ලෝ සතුන් එතෙර
කරවන  බැවින් සත්ථා
දේව මනුස්සානං නම්
විය.

සම්මා සංකප්ප

## බුද්ධෝ

බුදු රජාණන් වහන්සේ
අවබෝධ කරගත්
ධර්මය ඒ අයුරින්ම
අන්‍යන්ට දේශනා කර
අවබෝධ කරදුන් සේක.
බුද්ධ යන්නෙන් පසේ
බුදුවරු සහ රහතන්
වහන්සේ ද ගම්‍ය වන
බැවින් සම්මා සම්බුද්ධ
යන්නක් වෙනම පවසද්දී
අතිරේකව බුද්ධ යන්නක්
පැවසීම අනවශ්‍යය.

ඉතිපි සො භගවා අරහං සමමා සමබුදෙධා

විජජා චරණ සමපනෙනා සුගතො ලොකවිදූ අනුතතරො

පුරිසදමම සාරථී සතථා දෙවමනුසසානං බුදෙධා භගවාති

ආයුබෝවන් | Ayubowan

www.sinhalanet.net